සැ. යු.-2008.10.03 දින පළ කරන ලද අංක 1,570 දරන ගැසට් පත්‍රයේ I/II (අ) හා IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,571 - 2008 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා - 2008.10.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1280 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1281 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ඔක්තෝබර් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ඔක්තෝබර් මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරිනී තනතුර සඳහා අයැදුම්පත් කැඳවීම

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරිනී තනතුර සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. දිස්ත්‍රික්කය තුළ පදිංචි අය සම්බන්ධයෙන් විශේෂත්වයක් දක්වනු ඇත. මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරගත් අයැදුම්පත් 2008.10.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයැදුම්පත් එවිය යුතුය.

1. *රැකියා විස්තර.-* කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණයට පැමිණෙන අමුත්තන් හා මහජනයා ආචාරශීලීව පිළිගැනීම හා ඒ ඒ අයගේ අවශ්‍යතා පරිදි ඔවුන් අදාළ නිලධාරීන් හා අංශ වෙත යොමු කිරීම.

2. *වයස් සීමාව.-* අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. *අධ්‍යාපන සුදුසුකම්.-* සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය හා ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා. පෙළ) විෂයයන් 06 කින් සමත් විය යුතුය. (එක් වරකදී විෂයයන් 05 ක් සමත් විය යුතුය)

*හෝ*

සිංහල/දෙමළ භාෂාව ගණිතය හා ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විෂයයන් 06 කින් සමත් විය යුතුය. (එක් වරකදී විෂයයන් 05ක් සමත් විය යුතුය)

*හෝ*

පළමු භාෂාව, ගණිතය, ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04 කට “ඒ” හෝ “බී” ශ්‍රේණියේ සාමාර්ථයන් සහිතව ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය විෂයයන් 06 කින් සමත් විය යුතුය. (එක් වරකදී විෂයයන් 05ක් සමත් විය යුතුය)

*හෝ*

සිංහල, ඉංග්‍රීසි භාෂාවන් චතුර ලෙස කථා කළ හැකි විය යුතුය. දෙමළ භාෂාව පිළිබඳ ව්‍යවහාර දැනුමක් තිබිය යුතුය.

4. *6/2006 IV වැටුප් චක්‍රලේඛය හා පරිමාණය.-*

MN 1 13120-10X145-11X170-10x240-10X320 = 22040 (මාසික)

5. *සේවා කොන්දේසි :* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන අය තව දුරටත් එම විශ්‍රාම වැටුප් ක්‍රමයට ගැනෙනු ඇත. තෝරා පත් කර ගනු ලබන අයැදුම්කාරිය දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටියි.

6. *බඳවා ගැනීමේ ක්‍රමය :* සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

7. *අයැදුම්පත් ඉදිරිපත් කිරීම.-* අයැදුම්කරුවන් තම අයැදුම්පත් මෙහි දක්වා ඇති ආදර්ශ අයැදුම්පත්‍රයට අනුව සකස් කර 2008.10.31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ “දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ “පිළිගැනීමේ නිලධාරිනී තනතුරට බඳවා ගැනීම” යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. ඉල්ලුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

එස්. හපුආරච්චි,<br>
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ,<br>
අතිරේක ලේකම්.

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

## කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරිනී තනතුර සඳහා බඳවා ගැනීම

1. අයැදුම්කරුගේ මුලකුරු සමග නම :―――――;
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :―――――;
3. ජාතික හැඳුනුම්පත් අංකය :―――――;
4. වර්තමාන ස්ථිර ලිපිනය :―――――;
5. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද :―――――;
(උපතින්ද, නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න) :―――――;
6. විවාහක/අවිවාහක බව :―――――;
7. උපන් දිනය : වර්ෂය:―――――; මාසය:――――; දිනය:――――;
8. අධ්‍යාපන සුදුසුකම් :―――――;
9. භාෂා හැකියාව :―――――;
10. පළපුරුද්ද :―――――;

මා විසින් ඉහතින් සඳහන් කර ඇති විස්තර මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බැව් සහතික කරන අතර, මෙම විස්තර වැරදි බැව් මා තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිදරව් වුව හොත් මාගේ සේවය අවසන් කිරීමට යටත් වන බවද, මම දනිමි.

――――――.<br>
අයැදුම්කරුගේ අත්සන.

දිනය:―――――.

10-281

**පොලිස් දෙපාර්තමේන්තුව**

පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායට පොලිස් කොස්තාපල් / පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම

ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2007.12.28 දින පළ කර තිබූ *රජයේ ගැසට් නිවේදන* අංක 1530 ට අනුව අයැදුම්පත් භාර ගැනීම 2008.10.11 දිනෙන් අවසන් වුවද, එම *ගැසට් පත්‍රයේ* වලංගු කාලය ඉදිරියට මාස 02 ක් හා දින 20කින් දීර්ඝ කර ඇති අතර, අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2008.12.31 දින වේ.

පොලිස්පති.

10-321/1

**පොලිස් දෙපාර්තමේන්තුව**

පොලිස් කොස්තාපල් / පොලිස් කොස්තාපල් රියදුරු, කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා බඳවා ගැනීම

ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2008.04.11 දින පළ කර තිබූ *රජයේ ගැසට් නිවේදන* අංක 1545 ට අනුව අයැදුම්පත් භාර ගැනීම 2008.10.11 දිනෙන් අවසන් වුවද, එම *ගැසට් පත්‍රයේ* වලංගු කාලය ඉදිරියට මාස 02 ක් හා දින 20කින් දීර්ඝ කර ඇති අතර, අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2008.12.31 දින වේ.

පොලිස්පති.

10-321/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

2008/2009 අධ්‍යයන වර්ෂය සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම

2008/2009 අධ්‍යයන වර්ෂය තුළ පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය සහ යාපනය යන විශ්ව විද්‍යාලවල පැවැත්වේ.

03. පාඨමාලාව සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. පාඨමාලාව සඳහා එක් මාධ්‍යයකින් පමණක් අයැදුම්කළ හැකිය.

එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| කොළඹ විශ්ව විද්‍යාලය | - | සිංහල මධ්‍යය සහ දෙමළ මාධ්‍යය |
| පේරාදෙණිය විශ්ව විද්‍යාලය | - | සිංහල මධ්‍යය |
| යාපනය විශ්ව විද්‍යාලය | - | දෙමළ මාධ්‍යය මධ්‍යය |

04. සෑම අයැදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතුය.

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරුවැසියකු වීම.
ii. 2008.11.10 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි වීම.
iii. මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්ත වීම.
iv. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.
v. පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලබා සේවය කිරීම.

(අ) ශ්‍රී ලංකා ගුරු සේවය (රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල උගන්වන ගුරුවරුන්ද ඇතුළුව) ;
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය ;
(ඇ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය ;
(ඉ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය.

vi. උපාධියෙන් පසු 2008.11.10 දිනට අංක 04 (v) හි දක්වා ඇති සේවාවලට අදාළ තනතුරක අවුරුද්දක සේවා කාලයක් සපුරා තිබීම.

සැළකිය යුතුයි.-

1. පිරිවෙන්, අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරු භවතුන්.-

(අ) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත් ;
(ආ) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බටවත් ;
(ඇ) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදවා ගන්නා බවටත් ;
(ඈ) ගුරුභවතා වෙනුවට වෙනත් ගුරුවරුන් නොඉල්ලන බවටත් ;
(ඉ) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත් ;
කෘත්‍යාධිකාරී/පාලක මණ්ඩල කළමණාකරු සහතික කරන ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

2. අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයට යටත්ව සිටින අයදුම්කරුවන් 2008.11.10 දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්ය සේවා කාලය අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක් වත් (05) සම්පූර්ණ කර තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

3. විශ්ව විද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති අයටත්, අධ්‍යාපනවේදී උපාධිධාරීන්ටත් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකිය.

4. පාඨමාලාව හැදෑරීමට පේරාදෙණිය විශ්ව විද්‍යාලය ඉල්ලුම් කරන 2005 වසරේ හෝ ඉන් පසු පත් වීම් ලැබූ උපාධිධාරී ගුරුවරුන් "නවක උපාධිධාරීන් වෘත්තීයාභිමුඛ කිරීමේ ත්‍රෛමාසික පාඨමාලාව" හදාරා අවසන් කර තිබිය යුතුය.

05.

1. *තෝරා ගැනීමේ පිළිවෙල* :

(i) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) අයදුම්කරුවන් ලිඛිත, පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සිදුකරන අතර, පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

(iii) *ගැසට් නිවේදනයේ* 4 (V) හි අයදුම්කරු අයත්වන සේවාවට අදාළ තනතුරෙහි සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත. සේවා කාලය එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ. සේවා කාලය සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. අයදුම්කරුවකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු/ඇය අදාළ තනතුරේ වැඩ භාරගත් දිනයේ සිටය.

(iv) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම් කළහොත් පාඨමාලාවට තෝරා ගනු ලබන සංඛ්‍යාවෙන් 01%ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.

(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලබන සංඛ්‍යාව එක් එක් විශ්ව විද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

2. *ලිඛිත පරීක්ෂණය* :

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවලදී පැවැත්වේ.

(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා කැමති මධ්‍යස්ථානයක දී කැමති මාධ්‍යයකින් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකිය. අයදුම්කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.

(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳව ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් කටයුතු කළ යුතුය.

(iv) ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විතය.

*(අ) සාමාන්‍ය දැනීම.-*

කාලීන තොරතුරු සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටළු පිළිබඳ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01)

*(ආ) අභියෝග්‍යතාවය.-*

භාෂා හැකියාව, අවබෝධය, තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01යි, මිනිත්තු 30 යි)

3. *සම්මුඛ පරීක්ෂණය.-*

(i) සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතුය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* 4(V) හි අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. විශේෂයෙන්ම තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතුය. එය අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණු ලබා ගැනීමට උපකාර වනු ඇත.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

(i) දී ඇති ආදර්ශ ආකෘතිපත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කළ යුතුය.

(ii) දෘෂ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙලවරේ රතු පාටින් “දෘශ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි” යනුවෙන් සඳහන් කළ යුතුය.

(iii) *විභාග ගාස්තු ගෙවීම.*— විභාග ගාස්තු වශයෙන් රු. 300 ක මුදලක් ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබා ගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි අලවන්න. 2008.10.10 සිට 2008.11.10 දින දක්වා සියලුම තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවා ඇත.

(iv) *අයදුම්පත් එවීම :*

*(අ)* අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ “පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව” යනුවෙන් සඳහන් කළ යුතුය.

*(ආ)* 2008.11.10 දින හෝ ඊට පෙර ලැබෙන සේ “විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් හා තක්සේරු සේවාව, පැලවත්ත බත්තරමුල්ල” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.

(v) කාල සටහන් හා ප්‍රවේශ පත්‍ර විභාග අපේක්ෂකයන් වෙත තැපැල් මගින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාග පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර නොලැබුණහොත් “විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල” යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිතව දැන්විය යුතුවේ.

*(අ)* විභාගයේ නම :——————;
*(ආ)* විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :——————;
*(ඇ)* ලිපිනය :——————;
*(ඈ)* මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :——————;
*(ඉ)* ඉල්ලුම්පත තැපැල් කළ දිනය :——————;
*(ඊ)* ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාල හා ලදුපත් අංකය :——————;

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාර දීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයේ දී තමුන්ගේ අනන්‍යතාවය වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මගින් තහවුරු කළ යුතුය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවන් යම් විශ්ව විද්‍යාලයකට තෝරා ගැනීමෙන් පසු විශ්ව විද්‍යාල මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරා ගැනීමෙන් පසුව වුවද *ගැසට්* නිවේදනයට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂකයෙකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදුවේ.

07. *අධ්‍යයන නිවාඩු.*— තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ඒ සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේත්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේත්, ජාතික පාසල්, පෞද්ගලික පාසල්, පිරිවෙන්වල සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලවල අයගේත් අධ්‍යයන නිවාඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද, සෙසු අයදුම්කරුවන්ගේ අධ්‍යයන නිවාඩු පළාත් අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කර ගත යුතුය.

08. *බැඳුම්කරය.*— පාඨමාලාවට තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු අවුරුදු තුනහමාරක (අවු. 3 1/2) අවම කාල පරිච්ඡේදයක් ඔහු/ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/අධ්‍යාපන ලේකම් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. පුහුණුව සඳහා වැය වන මුදල රු. 10,000 ඉක්මවන කල්හි ඇප බැඳුම්කරය අනුව අනිවාර්ය සේවා කාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීතිරීති අනුව තීරණය වනු ඇත.

09. තෝරා ගනු ලැබූ අයදුම්කරුවෙකු පාලනය කරගත හැකි හේතූන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාල සීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ඇත.

11. මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

**2008/2009 වර්ෂය සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර)**
**පූර්ණකාලීන පාඨමාලාව සඳහා තෝරා ගැනීම**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| පාඨමාලාව සඳහා ඉල්ලුම්කරන විශ්ව විද්‍යාලය (කොළඹ/පේරාදෙණිය/යාපනය) | ඉල්ලුම්කරන මාධ්‍යය (සිංහල/දෙමළ) | ඉල්ලුම්කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය) |
|---|---|---|
| | | |

01. (i) මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන්) :————. හිමි/මයා/මිය/මෙනවිය
උදා.- Mr. SILVA, A. B. C. :————.
(ii) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(iii) සේවය කරන පාසලේ/ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය |
|---|---|---|
| | | |

(vi) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/පෞද්ගලික පාසල්/පිරිවෙන්/වෙනත්) :————.

03. (i) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(ii) 2008.11.10 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

04. උපාධිය පිළිබඳ විස්තරය :–

| උපාධිය | විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය (දින ..... සිට දින .... දක්වා) | උපාධිය සමත් වූ වසර | උපාධිය වලංගු දිනය | උපාධි විෂයයන් | සාමාර්ථයේ ස්වභාවය | ආයතනය/ විශ්ව විද්‍යාලය | උපාධිය (අභ්‍යන්තර/ බාහිර) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

05. (i) පළමු පත්වීමේ තනතුර :————. පළමු පත්වීමේ දිනය :————.
(ii) ගැසට් නිවේදනයේ 04(V) වගන්තියේ දැක්වෙන තනතුරට පත්කළ දිනය :————.
(iii) එම තනතුරේ වැඩ භාරගත් දිනය : ————.
(iv) උපාධියෙන් පසු ගුරු සේවයේ/විදුහල්පති සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ගුරු අධ්‍යාපනඥ සේවයේ තනතුරක 2008.11.10 වැනි දිනට සේවා කාලය : ————.

06. වෘත්තීය පුහුණුව පිළිබඳ විස්තර :–

(i)

| පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත්) | පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය) | ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාල සීමාව | |
|---|---|---|---|
| | | දින සිට | දින දක්වා |
| | | | |

(ii) ඔබ නවක උපාධිධාරී ගුරුවරුන් වෘත්තියාභිමුඛ කිරීමේ පාඨමාලාව හදාරා තිබේද ?
(මෙය 2005 වසර හෝ ඉන් පසු පත්වීම් ලැබූ උපාධිධාරී ගුරුවරුන් සඳහා පමණි)

07. ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :–

| අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය | බැඳුම්කර කාලය .................................. දින සිට .............................. දින දක්වා | බැඳුම්කරය සම්පූර්ණ කිරීමට ඉදිරියට ඇති කාලය |
|---|---|---|
| | | |

සටහන.- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැලකේ.

08. ඉල්ලුම්කරුට විරුද්ධව විනයානුකූලව පරීක්ෂණයක් පවතී ද? (ඔව්/නැත)................................................................... පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු : ..........................................................................................................................................................................

09.

| | | |
|---|---|---|
| තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | | ........................................... දිනැති කුවිතාන්සි අංක ............................. යටතේ ................. තැපැල්/උප තැපැල් කාර්යාලයට රු. ......................................... (අකුරෙන්) ගෙවන ලද බවට සහතික කරමි. |

10. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති සියළුම තොරතුරු නිවැරදි සහ සත්‍ය බවටද, 2008.10.10 දින *ගැසට් නිවේදනයේ* 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවටද, විභාග පනතෙහි අයදුම්කරුවන් සඳහා වූ නීතිරීතිවලට එකඟව කටයුතු කරන බවටද නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවට ද මෙයින් සහතික වෙමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

11. *පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීම පිළිබඳ නිර්දේශය :*
(විදුහල්පති, පීඨාධිපති, කෘත්‍යාධිකාරි, පාලක මණ්ඩලයේ කළමණාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා)

උක්ත නම් සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සළකා බලා මෙම අයදුම්කරු නිදහස් කරමි/නිදහස් නොකරමි.

__________.
විදුහල්පතිගේ/ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :__________.

10-351

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2009

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ගුරු අධ්‍යාපනය පිළිබඳව තුන් අවුරුදු පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාවය :*

*සෑම අයදුම්කරුවකුම-*

2.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

2.2 විශිෂ්ඨ චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.

2.3 *වයස :*
2.3.1. 2009.01.01 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

2.4 අවිවාහක විය යුතුය.

03. *මූලික අධ්‍යාපන සුදුසුකම් :*

3.1 2007 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) එකවර සමත් වීම.

(තාක්ෂණ අධ්‍යයන පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.6 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තියද කියවන්න.)

3.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළු හර විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන තුනක් (03) සහිතව සමත්වීම. (පළමු අවස්ථාවේ දී අවම වශයෙන් හර විෂයයන් පහකින් (05) සමත් විය යුතුය).

3.3 ඒ ඒ පාඨමාලාවට අදාළ අ.පො.ස (සා.පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතුය. විශේෂ සුදුසුකම් පිළිබඳව සලකා බලනු ලබන්නේ 3.2 හි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පමණි. විශේෂ සුදුසුකම් පිළිබඳව විශේෂයෙන් සඳහන් කර නොමැති විටෙක සලකා බලනු ලබන්නේ 3.2 හි සඳහන් සුදුසුකම්ය.

3.4 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හා ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය.

3.4.1. ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම්කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ.

3.4.2 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ. අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් සමත්ව ඇති අයදුම්කරුවන්

අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ප්‍රමාණවත් වේ. කෙසේ වුවද ප්‍රවීණතා පරීක්ෂණයේදී සමාන ලකුණක් ලබා ඇති අයදුම්කරුවන් කීප දෙනෙකු අතරින් එක් අයෙක් තෝරා ගැනීමට සිදුවන විටෙකදී ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ඨ සම්මාන/අධි සම්මාන, ඉංග්‍රීසි සාහිත්‍යට විශිෂ්ඨ සම්මාන/අධි සම්මාන/සම්මාන සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

3.4.3 බටහිර සංගීතය හා තොරතුරු සංනිවේදන තාක්ෂණය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වුව ද, සිංහල හා දෙමළ මාධ්‍යය පාසල්වල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කොටගෙන සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. (උ.පෙළ) හැදෑරූ සිසුන් අතුරින් බඳවා ගනු ලැබේ.

3.5 සියළුම සුදුසුකම් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

04. *අධ්‍යාපන සුදුසුකම් හා විශේෂ අවශ්‍යතා.-* ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා පහත දැක්වේ—

4.1 ***පාඨමාලා අංකය 01 - ඉංග්‍රීසි***

4.1.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (සාමාන්‍ය ඉංග්‍රීසි නොවේ) ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයය හයකින් (06) අ.පො.ස (සා. පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සමත්වීම ;

හෝ

4.1.2 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් සමත්වීම හා 2007 වර්ෂයේ දී පවත්වන ලද ලන්ඩන් අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් තුනකින් එකවර සමත්වීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව විෂයයන් හයකින් සමත්වීම ;

හෝ

4.1.3 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්වීම ;

*සැළකිය යුතුයි.-*

(i) ඉංග්‍රීසි පාඨමාලාවට තෝරා ගැනීමේ දී 4.1.1 හා 4.1.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. ඔවුන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතුය.

(ii) 4.1.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

4.2 ***පාඨමාලා අංකය 02 - විද්‍යාව (දෙමළ)***

4.2.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් (03) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත්වීම ;

හා

4.2.2 දෙමළ භාෂාවට සාමාර්ථය හා 32 ගණිතය හෝ 42 ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම ;

4.3 ***පාඨමාලා අංකය 03 - ගණිතය (දෙමළ)***

4.3.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ගණිතය විෂයය ධාරාවට අයත් ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය යන විෂයයන් එකක් සහිතව ඉහත විෂයයන් දෙකකින්) සමත්වීම ;

සහ

4.3.2 දෙමළ භාෂාවට සාමාර්ථය හා 34 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම ;

4.4 *පාඨමාලා අංකය 04 - ශාරීරික අධ්‍යාපනය (සිංහල)*
*04 - ශාරීරික අධ්‍යාපනය (දෙමළ)*

4.4.1 2007 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

4.4.2 සිංහල/දෙමළ භාෂාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය හා ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම ;

*හා*

4.4.3 පිළිගත්, ජවන හා පිටිය මළල ක්‍රීඩා සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් ලබා තිබීම, විවිධ ක්‍රීඩා/ඉසව් තුනකට උපරිම වශයෙන් ලකුණු 75 ක් ප්‍රදානය කිරීම පහත දැක්වෙන අනුපිළිවෙලට සිදුකරනු ලැබේ.

*ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙල*

| *අනු අංකය* | *මට්ටම/විෂය* | *කේවල* | *සමූහ* | *ස්ථානය/ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 22 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 21 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 20 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 19 |
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 18 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 17 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 16 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 15 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 14 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 13 |
| 14 | පළාත් මට්ටම | කේවල | - | 1 | 12 |
| 15 | පළාත් මට්ටම | කේවල | - | 2 | 11 |
| 16 | පළාත් මට්ටම | කේවල | - | 3 | 10 |
| 17 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 09 |
| 18 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 08 |
| 19 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 07 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/බලයලත් නිලධාරි 1 | - | - | - | 06 |
| 21 | ජනාධිපති බාලදක්ෂ/බාල දක්ෂිකා | - | - | - | 06 |
| 22 | සාජන්ට් මේජර්/බළලත් නිලධාරි 2 | - | - | - | 05 |
| 23 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 1 | 06 |
| 24 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 2 | 05 |
| 25 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 3 | 04 |
| 26 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 1 | 03 |
| 27 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 2 | 02 |
| 28 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 3 | 01 |

4.4.4 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට ඔවුන් ලබා ඇති සාමාර්ථයන් අනුව අතිරේක ලකුණු හිමිවේ.

A සාමාර්ථය - 05
B සාමාර්ථය - 03
C සාමාර්ථය - 02

*සැළකිය යුතුයි.-*

(i) *පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික).-* අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මඟින් (චෙස්, කැරම්,දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගි වන අන්තර් ජාතික තරග (පාසල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගි වන අන්තර් ජාතික තරග සලකා නොබැලේ.)

(ii) *පිළිගත් ක්‍රීඩා තරග.-* අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරඟ/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරඟ.

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද ඒ ශ්‍රේණියේ තරගවල 1,2 හා 3 වන ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ 05 තුළ ලබාගත් ක්‍රීඩා ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් මේ සඳහා වලංගු වේ.

(v) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමි වන්නේ එකම ඉසව්වකට එකම වසරක දී ලබාගත් සහතික වලින් එක් ඉහළම සහතිකයකට පමණි.

4.5 *පාඨමාලා අංකය 05 - විශේෂ අධ්‍යාපනය*

4.5.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයන් තුනකින් (03) සමත්වීම ;

*හා*

4.5.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් අ.පො.ස (සා/පෙළ) සමත් වීම.

4.6 *පාඨමාලා අංකය 06 - තාක්ෂණ අධ්‍යයනය*

4.6.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් (03) කින් සමත්වීම ;

*හා*

4.6.2 අ.පො.ස (සා/පෙළ) සාමාර්ථය

4.6.2.1 *නිර්මාණකරණය හා තාක්ෂණවේදය.-*

ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, ලී වැඩ /මේසන් වැඩ/ ඉදිකිරීම් තාක්ෂණය, ලෝහ වැඩ / මෝටර් කාර්මික ශිල්පය/ යාන්ත්‍රික තාක්ෂණය/ ගුවන් විදුලි කාර්මික ශිල්පය / විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව හර විෂයයන් 6 කින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සමත්වීම.

4.6.2.2 *ශිල්ප කලා.-*

ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, විවීම/මැටි ශිල්පිය/කලා ශිල්ප යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) කින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සමත්වීම.

*හා*

4.6.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තීය පුහුණු අධිකාරිය/පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව/ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යන ආයතන මගින් පවත්නා විෂය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස 10ට නොඅඩු විෂයය ක්ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

*සැළකිය යුතුයි.-*

(i) *තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල.-*

*(අ)* 4.6.1, 4.6.2, 4.6.3 සහතික ඇති අයදුම්කරුවන්
*(ආ)* 4.6.1 හා 4.6.3 සහතික ඇති අයදුම්කරුවන්
*(ඉ)* 4.6.1 හා 4.6.2 සහතික ඇති අයදුම්කරුවන්

එසේ වුවද ඉහත (අ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2006 සහ 2005 වසර වලදී අ.පො.ස (උ/පෙළ) සමත්ව එම සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර සලකා බැලීමෙන් පසුව (ආ) හා (ඉ) හි සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් සලකා බැලේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ නිර්මානකරණය හා තාක්ෂණ වේදය/ශිල්ප කලා යන්න පැහැදිලිව සටහන් කළ යුතුය.

(iii) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ ඉහත (i) හි සඳහන් (අ), (ආ), හා (ඉ) ප්‍රමුඛතා අනුපිළිවෙලින් කුමක් යටතේ ද යන්න ඉල්ලුම් පත්‍රයේ අංක 13 යටතේ ඇති "ශිල්පීය පාඨමාලාවේ නම" සඳහන් කොටුවේ ලියන්න.

4.7 *පාඨමාලා අංකය 07 - බටහිර සංගීතය*

4.7.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වීම ;

*හෝ*

4.7.2 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වීම ;

*හා*

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (න්‍යායික හා ප්‍රායෝගික)

*හෝ*

අ.පො.ස (උ.පෙළ) බටහිර සංගීතය විෂයය අමතර විෂයයක් ලෙස සමත්ව තිබීම.

*සැළකිය යුතුයි ඃ*

(i) බටහිර සංගීත පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා වීම.

(ii) එම පාඨමාලාවට තෝරාගැනීමේ දී ඉහත 4.7.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

4.8 *පාඨමාලා අංකය 08 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය*

4.8.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (ශ්‍රී පාද අධ්‍යාපන විද්‍යා පීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත් වීම ;

*හා*

4.8.2 ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම

*සැළකිය යුතුයි.-*

(මෙම පාඨමාලාවට අයදුම්කරන අයදුම්කරුවන් තෝරාගැනීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුවේ).

4.9 *පාඨමාලා අංකය 09 - දෙවන බස (සිංහල)*

4.9.1 දෙවන බස සිංහල පාඨමාලාවේ අයදුම්කරුවන් 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.9.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් 06කින් සමත් වීම.

*(සැළකිය යුතුයි.-* මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී දෙවන භාෂාව දෙමළ විෂයය හෝ වෛකල්පිත දෙමළ භාෂාව හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (දෙමළ) උසස් පාඨමාලාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ.).

4.10 *පාඨමාලා අංකය 10 - දෙවන බස (දෙමළ)*

4.10.1 දෙවන බස (දෙමළ) පාඨමාලාව අයදුම්කරුවන් 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් සමත් වීම ; හා

4.10.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය, දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06කින් සමත් වීම.

*(සැළකිය යුතුයි.-* මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී දෙවන භාෂාව සිංහල විෂයය සමත් වීම හෝ වෛකල්පිත සිංහල විෂයය සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ.).

4.11 **පාඨමාලා අංකය 11 - ප්‍රංශ භාෂාව**

4.11.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ප්‍රංශ භාෂාව ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.11.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළු විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

*(සැළකිය යුතුයි.-* (i) බටහිර සංගීතය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.).

5.0. *2009 වර්ෂය සඳහා ශික්ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය :*

5.1 තෝරා ගැනීමේ පදනම—

5.1.1 2012 වසරේ පාසැල් පද්ධතියේ ගුරු අවශ්‍යතාව පදනම් කර ගෙන බඳවා ගන්නා ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත ;

5.1.2 බඳවා ගැනීමේ මූලික පදනම Z ලකුණු කුසලතාව වේ. ඉංග්‍රීසි/තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ශාරීරික අධ්‍යාපනය යන පාඨමාලාවලට ප්‍රවීණතා පරීක්ෂණය/ක්‍රීඩා කුසලතාව අනුව තෝරාගනු ලැබේ. ප්‍රවීණතා/ක්‍රීඩා කුසලතා එකම ලකුණක සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදුවන අවස්ථාවක Z ලකුණු කුසලතාව බලපැවැත් වේ. ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය හැර අනෙකුත් සියළුම විද්‍යාපීඨවල පවත්වන පාඨමාලා සඳහා ජාතික මට්ටමෙන් 30% ක් ද, දුෂ්කර මට්ටමෙන් 70%ක් ද තෝරාගනු ලැබේ ;

5.1.3 බටහිර සංගීතය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට ඉල්ලුම්කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම්කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් ද, සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව හර විෂයය හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සමත් වීම අවශ්‍ය වේ ;

5.1.4 ශාරීරික අධ්‍යාපනය සහ බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී යෝග්‍යතාවය පිළිබඳව සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතුය.

5.2 දුෂ්කර දිස්ත්‍රික්ක පදනම —

5.2.1 දුෂ්කර දිස්ත්‍රික්ක සඳහා බඳවාගනු ලබන්නේ අධ්‍යාපන පහසුකම් බෙදීයාම අනුව දුෂ්කර යැයි සලකනු ලබන දිස්ත්‍රික්ක 17ට අයත් අයදුම්කරුවන් ගෙනි.

(මාතලේ, මුලතිව්, අනුරාධපුරය, නුවරඑළිය, වව්නියාව, පොළොන්නරුව, හම්බන්තොට, ත්‍රිකුණාමලය, බදුල්ල, යාපනය, මඩකලපුව, මොණරාගල, කිලිනොච්චිය, අම්පාර, රත්නපුර, මන්නාරම, පුත්තලම) ;

එක් එක් දිස්ත්‍රික්කයෙන් ඒ ඒ මාධ්‍යයෙන් 2007 අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ගහණයේ සමානුපාතයට සෑම පාඨමාලාවකටම ඒ ඒ දිස්ත්‍රික්කයන්ගෙන් බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

5.2.2 එක් එක් දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටි අවස්ථාවකදී වෙනත් දුෂ්කර දිස්ත්‍රික්කවලින් පුරප්පාඩු පුරවනු ලැබේ.

5.2.3 *දිස්ත්‍රික්ක නිර්ණය කිරීම :*

5.2.3.1 යම් පාසල් අපේක්ෂකයකුගේ දිස්ත්‍රික්කය වන්නේ පළමුවරට අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි මාසයට පෙරාතුව වූ මාසය දක්වා වූ වසර 5 තුළ සම්පූර්ණ කාලය හෝ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2ට වැඩි) ඔහු/ඇය ඉගෙනීම කළ පාසල/පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

5.2.3.2 යම් පෞද්ගලික අපේක්ෂකයකු ඊට ප්‍රථමයෙන් පාසල් අපේක්ෂකයෙකු වශයෙන් පළමුවරට අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට පාසල හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ ප්‍රථමයෙන් එකී විභාගයට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කයයි.

5.2.3.3 යම් පෞද්ගලික අපේක්ෂකයකු යම් හෙයකින් පාසල් අපේක්ෂකයෙකු වශයෙන් අ.පො.ස (උ.පෙළ) විභාගයට කලින් පෙනී නොසිට පාසල් හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ අ.පො.ස (උ.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටි මාසයට පෙරාතුවම වූ මාසයේ අවසාන දිනය දක්වා ඇති වර්ෂ 05 තුළ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) අධ්‍යාපනය ලැබූ පාසල හෝ පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

5.2.3.4 පාසල් අධ්‍යාපනය නොලැබූ පෞද්ගලික අපේක්ෂකයකු නම් ග්‍රාමසේවා නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්ගේ දිවුරුම් ප්‍රකාශයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාම ලේඛනය මඟින් පමණක් ඉහත දිස්ත්‍රික්කයට පදිංචිය තහවුරු කළ යුතුය.

5.3 ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයට තෝරා ගැනීම :

5.3.1 පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75% ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25% ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

5.3.2 දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා 75% ක් ද, සිංහල මාධ්‍ය පාඨමාලා සඳහා 25% ක් ද තෝරා ගනු ලැබේ.

5.3.3 දෙවන බස (සිංහල) සිංහල මාධ්‍යයෙන් ද, ගණිතය, විද්‍යාව, දෙවන බස (දෙමළ) යන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද පැවැත් වේ ;

5.3.4 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි අයගේ දරුවන් පමණි ;

5.3.5 තෝරා ගැනීමේ දී ඉහත සඳහන් වැවිලි දිස්ත්‍රික්ක එකොළහෙහි වතු අංශයෙහි පදිංචි වතු සේවකයන්ගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා වතු අධිකාරිගේ ලිපිය (සේවකයා සේවය කළ දින වකවානු සහිතව) පසුගිය වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් වතුවල ස්ථිරව පදිංචිව සිටින බවට වතු අධිකාරි විසින් සහතික කරන ලද ලිපිය පුහුණුවෙන් පසුව වතු අංශයේ පාසල්වල අඛණ්ඩව වසර 10 ක් අනිවාර්යෙන් සේවය කරන බවට පොරොන්දු වන ලිපියක් හා සේවක අර්ථසාධක අරමුදලට අය කිරීම් කරන බව ලියාපදිංචි අංක සහිතව ඔප්පු කරන ලිපි සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ. ඉල්ලුම්කරුගේ දිස්ත්‍රික්කය නිර්ණය කිරීමේ පදනම දැක්වෙන 5.2.2 ඡේදය ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම්කරුවන් තෝරා ගැනීමේ දී ද අදාළ කරගනු ලැබේ ;

5.3.6 ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටක දැනට වතු අංශයේ සේවය නොකළ ද පෙර වතු සේවයේ යෙදී සිට දැනට වතුවලින් බාහිරව පදිංචි අයදුම්කරුවන් සලකා බලනු ලැබේ ;

5.3.7 ඉහත 5.3.6 යටතේ ප්‍රමාණවත් සංඛ්‍යාවක් තෝරාගත නොහැකි වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ සිංහල මාධ්‍ය අනෙකුත් පාඨමාලාවලට තොරා ගැනීම සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණ වලිනි ;

5.3.8 අදාළ සෑම දිස්ත්‍රික්කයකින්ම අවම වශයෙන් එක් අයදුම්කරුවෙකුවත් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. ;

***සැලකිය යුතුයි.***- සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවයක් ඇති අයදුම්කරුවෙකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන්ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවකු නම් සිංහල මාධ්‍යය ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ.

6.0 *තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු* :

6.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මූලික පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන් තෝරා ගනු නොලැබේ.

6.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමකට ළඟා වීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික මානසික යෝග්‍යතාව පිළිබඳ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වූ අවස්ථාවක එකී තත්ත්වයන් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් නොවේ නම් විශේෂ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක පරීක්ෂණයකට භාජනය කොට එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

6.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට දින 03 ක් ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ඇයට අහිමි වනු ඇත. මේ අනුව ඇති වන පුරප්පාඩු කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.

6.5 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත දැයි පරීක්ෂාකර බැලීම සඳහා විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

6.6 යම් පාඨමාලාවකට/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට තෝරා ගත් පසු ඒ පාඨමාලාව/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ළඟම ඇති විද්‍යාපීඨයකට අදාළ පාඨමාලාව හැදෑරීමට මාරු කරනු ලැබේ.

6.7 යම්කිසි පාඨමාලාවක් සඳහා තෝරා ගැනීමේ දී අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී යම්කිසි එකම ලකුණක් ලබා ගෙන ඇති අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව තවදුරටත් තෝරා ගත යුතු පුරප්පාඩු සංඛ්‍යාවට වැඩිනම්, අදාළ අයදුම්කරුවන්ගේ පළමු වරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට ඉදිරිපත් වූ ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ට සාමාර්ථයකට ලකුණු 03 ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02 ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01 ක් ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08 කට පමණක් සීමා කෙරේ.

7.0 *පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන් :*

7.1 දැනටමත් රජයේ හෝ පෞද්ගලික පාසල්වල ගුරු පත්වීම ලබා ඇති අය,

7.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,

7.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරන හෝ හැදෑරූ අය,

7.4 විශ්වවිද්‍යාලයක/විශ්වවිද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/අ.පො.ස (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවා ගන්නා පාඨමාලාවක ලියාපදිංචි/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය, විනයානුකූල හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ඉවත් කරනු ලැබූ අය.

8.0 *පුහුණුව සඳහා අදාළ කොන්දේසි :*

8.1 පුහුණු පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්තව සිදු කෙරෙන වසරක සීමාවාසික පුහුණුවකින්ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90% කට නොඅඩු විය යුතුය.

8.2 සෑම ශික්ෂණලාභියෙකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ පරීක්ෂණවලින් ද, දෙවන වසර අවසානයේ පවත්වනු ලබන අභ්‍යන්තර පරීක්ෂණවලින් ද, දෙවන වසර අවසානයේ පවත්වන ලබන අභ්‍යන්තර පරීක්ෂණයෙන් ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතුයි. එමෙන්ම ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා හදාරන අය හැර අනෙක් සියළුම පාඨමාලා හදාරන අය ඉහත විභාගවලදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතුය. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ එම කොන්දේසිවලට එකඟ වන අය පමණි.

8.3 ශික්ෂණලාභියෙකුට නේවාසික පුහුණුව ලබන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස 10 ක් සඳහා මාසයකට රු. 2000ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසි වර්ෂය තුළ දී මාස 10 ක් සඳහා මාසයකට රු. 2500 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතුය.

8.4 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විශ්වවිද්‍යාලයක, විශ්වවිද්‍යාල විද්‍යායතනයක, වෙනත් ආයතනයක උසස් පෙළ සුදුසුකම්වලින් බඳවා ගන්නා පාඨමාලාවක, අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. එසේ පාඨමාලාවක නිරත වන බව සනාථ වුවහොත් ශික්ෂණලාභියා බැඳුම්කරයට එකඟ වූ මුළු මුදල ආපසු අය කරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

8.5 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විවාහවුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ.

8.6 පුහුණුවන කාල සීමාව තුළ අපේක්ෂිත හැසිරීම, උද්යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන ශික්ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේම ශාස්ත්‍රීය පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අසමත් හෝ 8.4 ඡේදයේ දැක්වෙන පාඨමාලාවක් හදාරන බව සනාථ වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යායතනික මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

8.7 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියාගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත විශේෂ සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර අවසාන තීරණය ගනු ලැබේ.

8.8 පුහුණුව සඳහා නියමිත අවුරුදු තුනේ කාල සීමාව සම්පූර්ණ කිරීමට පෙර පුහුණුව අත්හරින්නේ නම් පුහුණු කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමග බැඳුම්කරයට එකඟ වූ මුළු මුදල ආපසු ගෙවන බවට ශික්ෂණලාභීන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු වේ.

8.9 පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු විෂයය සමගාමී කටයුතු ඇතුළු) පුහුණුවීම් කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

8.10 මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන් දුෂ්කර දිස්ත්‍රික්කවල අධ්‍යාපන කලාප මට්ටමින් ඇති වන ඇබෑර්තු පදනම් කර ගෙන ගුරු පත්වීම් ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.

8.10.1 අනාගතයේ දී රජයේ පාසල්වලට ගුරු පත්වීම් දීමේ දී මෙම පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. එබැවින් පාඨමාලා සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලබන අයදුම්කරුවන් ඉහත කොන්දේසිවලට එකඟවන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් කළ යුතුවේ.

8.10.2 ඉහත කොන්දේසි යටතේ පුහුණුව ලබන අයදුම්කරුවන් තමා පත්වීම් ලබන දුෂ්කර දිස්ත්‍රික්කයේ/අධ්‍යාපන කලාපය අවම වශයෙන් පත්වීම් දින සිට පස් අවුරුද්දක් (05) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ගිවිසුමකට බැඳිය යුතුය. පත්වීම් ලබා දෙන අධ්‍යාපන කලාපය කිසිසේත් වෙනස් කරනු නොලැබේ ;

8.11 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ලියාපදිංචි වන අයදුම්කරුවන්ට පුහුණුවට වැයවන මුදල සහ වෙනත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 5,00,000 ක බඳුම්කරයකට අත්සන් කළ යුතුය. පාඨමාලාව අතරමග නවතා ඉවත්වන හෝ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව වසර 05 ක් රජය යටතේ සේවය නොකරන අයෙකු මෙම බැඳුම්කරයෙහි සම්පූර්ණ මුදල රජයට ගෙවීමේ කොන්දේසියකට යටත් වේ.

8.12 සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

9.0 *අයදුම් කිරීම* :

9.1 එක් අයදුම්කරුවෙකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට (03) අයදුම් කළ හැකිය.

9.2 එක් අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් (02) පමණක් එකම කවරයක බහා ඉදිරිපත්කළ යුතුය. එක් අයදුම්කරුවෙකු විසින් ඉහත ඉල්ලුම්පත් හා සහතික කළ ඡායා පිටපත් දෙක හැර වෙනත් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත්නම් සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.3 අයදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතුය.

9.4 අයදුම්පත්‍ර 2008.10.31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), විද්‍යාපීඨ ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ, 2009 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් වීම සඳහා අයදුම්පත්‍රය, පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලාව ............. සහ අංකය..............යන කරුණු පිළිබඳ තොරතුරු පැහැදිලි ලෙස ලිවිය යුතුය. (විභාග දෙපාර්තමේන්තුවට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට හෝ අයදුම්පත්‍ර නොඑවිය යුතු බව අවධාරණය කරමි.).

9.5 විද්‍යාපීඨ බඳවා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දීම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එම නිසා ඒවා අයදුම්කරු ළඟ තබා ගත යුතුය.

9.6 විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය නිවැරදිව ඇතුළත් නොකරන ලද හා අසම්පූර්ණ අවිධිමත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.7 අයදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

9.8 අයදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය.

9.9 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

10.0 *ගැසට් නිවේදනයේ* ඉහත සඳහන් තොරතුරු මත මතුවන ගැටළු පිළිබඳව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

11.0 මෙම *ගැසට් නිවේදනයෙහි* සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 25 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

*අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස් :*

1.0 *ගැසට් නිවේදනය කීපවරක් සැලකිල්ලෙන් කියවන්න.* ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම්පත්‍රයක පමණක් අයදුම් කරන්න. මෙම අයදුම්පත්‍රය හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කරන්න. (පාසල් අයදුම්කරුවන් විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් සාමදාන විනිශ්චයකරුවකු මගින් ද ඡායා පිටපත් දෙක සහතික කරවා ගත යුතුය.)

2.0 පහත දැක්වෙන ආදර්ශය අනුව A4 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21 x සෙන්ටි මීටර් 29.7 ) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න. (1.0 - 9.3 දක්වා ඡේද පළමුවන පිටුවට ඇතුළත් වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවලදී අදාළ කොටුව තුළ "X"ලකුණ යොදන්න.

3.0 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ පළමු පිටුවේ දැක්වෙන 1.0-9.3 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සලකන්න. විශේෂයෙන්ම පාඨමාලාවේ අංකය, අ.පො.ස (උ.පෙළ) විභාග අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිලිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

4.0 ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 12.0 ඡේදය ද, තාක්ෂණ අධ්‍යයනය සඳහා 13.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා 14.0 ඡේදය ද දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතුයි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේය :

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | හම්බන්තොට | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | පුත්තලම | 18 |
| කළුතර | 03 | කිලිනොච්චිය | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිව් | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වවුනියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොණරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| | | | | රත්නපුර | 25 |

6.0 මාධ්‍යය සඳහා අදාළ සංකේත මෙසේය : සිංහල -S , දෙමළ - T ඉංග්‍රීසි - E.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2009**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනයට පමණි.

(අයදුම්කරුවෙකු එක් අයදුම්පතක් හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන ලෙස සකස් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ 9 වෙනි ඡේදය දක්වා තොරතුරු පළමු පිටුවට ඇතුළත් කරන්න. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරන්න. 1.0-9.3 දක්වා තොරතුරු ඇසුරෙනි.)

1.0

| *මනාපය* | *පාඨමාලාවේ අංකය* | *මාධ්‍යය S/T/E* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

2.0 2.1 මුලකුරු සමඟ නම ඉංග්‍රීසියෙන් (In Block letters) නිදසුන : Mr. PERERA R. C.
Mr./Miss. :——————.

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් (In Block letters) :——————.

3.0 ස්ථිර පදිංචි ලිපිනය ඉංග්‍රීසියෙන් (In Block letters) :——————.

4.0 *ගැසට් නිවේදනයේ* 5.2.4 ඡේදයට අනුව දිස්ත්‍රික්කය :——————. දිස්ත්‍රික් අංකය [ ]

5.0 5.1 *උපන් දිනය :*

අවුරුද්ද : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

5.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ [1] ස්ත්‍රී [2]

7.0 ජන වර්ගය :

| සිංහල | ශ්‍රී ලංකා ද්‍රවිඩ | මෑත කාලීන ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ | මුස්ලිම් | වෙනත් |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |

8.0 2007 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල :

8.1 වර්ෂය : ☐☐☐☐

8.2 විභාග අංකය : ☐☐☐☐☐☐☐☐

8.3 Z අගය : ☐ . ☐☐☐☐

8.4 ප්‍රතිඵල විස්තරය විෂයය අනුව :

| විෂයය | විෂයය අංකය | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|
| 1.............................................. | ........................ | ........................ |
| 2.............................................. | ........................ | ........................ |
| 3.............................................. | ........................ | ........................ |

9.0 9.1 ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවල අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට ලැබූ ඉහළම ශ්‍රේණිය: ☐

වර්ෂය: ☐☐☐☐

විභාග අංකය : ☐☐☐☐☐☐☐☐

9.2 ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කරන අය තමන් වතු සේවක දරුවෙක් ද යන්න (අදාළ කොටුවේ X ලකුණෙන් දැක්විය යුතුයි.)

ඔව් [1] නැත [2]

9.3 ශාරීරික අධ්‍යාපනය සිංහල/දෙමළ අයදුම්කරුවන් තම අයදුම්පතෙහි 12.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව : ☐

10.0 2007 වර්ෂයට පෙර ඔබ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනීසිටියේ එක් විෂයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| | | 1 | 2 |
|---|---|---|---|
| 10.1 | විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 |
| 10.2 | වර්ෂය : | ................. | ................... |
| 10.3 | විභාග අංකය : | ................. | ................... |
| 10.4 | විභා. මධ්‍යස්ථානයේ අංකය : | ................. | ................... |
| 10.5 | Z අගය | ................. | ................... |

10.6 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| .................. | .................... | .................. | .................... |
| .................. | .................... | .................. | .................... |
| .................. | .................... | .................. | .................... |
| .................. | .................... | .................. | .................... |

11.0 සමත් වූ අ.පො.ස (සා.පෙළ) පිළිබඳ විස්තර :

| | | 1 | 2 | 3 |
|---|---|---|---|---|
| 11.1 | විභාගයට පෙනී සිටි වාර | | | |
| 11.2 | වර්ෂය : | .................. | .................. | .................. |
| 11.3 | විභාග අංකය : | .................. | .................. | .................. |
| 11.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය : | .................. | .................. | .................. |
| 11.5 | සමත් වූ විෂයයන් හා ශ්‍රේණි : | .................. | .................. | .................. |

| *(1 වාරය)* | | *(2 වාරය)* | | *(3 වාරය)* | |
|---|---|---|---|---|---|
| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
| 1. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 2. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 3. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 4. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 5. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 6. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 7. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |
| 8. ......................... | ......................... | ......................... | ......................... | ......................... | ......................... |

12.0 *ගැසට් නිවේදනයේ 4.4 ඡේදයේ 4.4.3 හා 4.4.4 වගන්තියට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර :*

(ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අයදුම් කරන අය පමණක් පිරවිය යුතුය.) මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.4.3 හි සියළු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/නිපුනතා තුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ.පො.ස (සා.පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමාර්ථ ලබා ඇත්නම් 4.4.4 ට අනුව ශ්‍රේණියට හිමි ලකුණද පහත කොටසෙහි සඳහන් කළ යුතුය. මුළු ලකුණුවල එකතුව මුල් පිටුවේ 9.3 හි ද ඇතුළත් කළ යුතුය.

| *අනු අංකය* | *වර්ෂය* | *නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/ සංගමය* | *තරග නියෝජනය කළ මට්ටම/අන්තර්ජාතික/ජාතික/ පළාත්/දිස්ත්‍රික්කය/කලාප* | *ඉසව්ව/ක්‍රීඩාව* | *ලැබූ ස්ථානය* | *4.4.3 ට අදාළ ලකුණු* |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| අ.පෙ.ස (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට ලද ශ්‍රේණිය | | | | | ලකුණු | |
| | | | | මුළු එකතුව | | |

13.0 *ගැසට් නිවේදනයේ 4.6.3 ඡේදයේ තාක්ෂණ අධ්‍යයනය පාඨමාලවට අනුව ඇතුළත් වීමට අපේක්ෂිත අයදුම්කරුවන් රජයේ පිළිගත් ආයතනයකින් ශිල්පීය පාඨමාලාවක් හදාර නිම කොට තිබේ නම් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුයි.*

| *ශිල්පීය පාඨමාලාවේ නම* | *රජයේ ලියාපදිංචි අංකය හා වලංගු දිනය* | *පවත්වන ලද ආයතනය* | *කාල සීමාව* | *පාඨමාලව සාර්ථක ලෙස නිමකර තිබේද?* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

14.0 ගැසට් නිවේදනයේ 4.7.1, 4.7.2 ඡේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් සංගීතය පිළිබඳ නිපුනතාවයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.

| වර්ෂය | සහතිකය නිකුත් කළ ආයතනය | ප්‍රවීණතාව/සමත් පන්තිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

15.0 අයදුම්කරුගේ ප්‍රකාශය :

(i) මා විසින් ඉදිරිපත් කර ඇත්තේ එක් අයදුම් පත්‍රයක් හා සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණි. එක් ඉල්ලුම් පත්‍රයක් හා එහි ඡායා පිටපත් දෙකකට වඩා ඉදිරිපත් කළ විට මාගේ සියළුම අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප වන බව මම දනිමි. ඉල්ලුම් කරනු ලබන විද්‍යාපීඨයේ පුරප්පාඩු නොමැති විටෙක අදාළ පාඨමාලාව පැවැත්වෙන පුරප්පාඩු ඇති වෙනත් විද්‍යාපීඨයකට ඇතුළත් වීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

(ii) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මවිසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මා දනිමි.

(iii) මා විශ්ව විද්‍යාල ප්‍රවේශයට අයදුම්කර නොමැති බවත්, විශ්ව විද්‍යාලයක/විශ්ව විද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් මෙයින් සහතික කරමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :__________.

16. පාසල්/පිරිවෙන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් විදුහල්පතිගේ/පිරිවෙන් අධිපතිගේ ප්‍රකාශය :

මෙම අයදුම්කරු මෙම පාසලේ/පිරිවෙනේ ශිෂ්‍යයෙකු වශයෙන් අ.පො.ස (සා.පෙළ) විභාගයට හා අ.පො.ස (උ.පෙළ) විභාගයට, අයදුම්කරු විසින් ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනුමේ හැටියට නිවැරදි බවත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ..................... වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අයදුම්කරු ලබා ගෙන ඇති Z අගය .................... (අකුරෙන්) ...................... බවත් සහතික කරමි.

__________,
විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ
අත්සන හා නිල මුද්‍රාව.

විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ නම :__________.
පාසලේ/පිරිවෙනේ නම හා ලිපිනය :__________.
දිනය :__________.

17. පෞද්ගලික අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය :

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ....................... වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී මා ලැබූ ඒකාබද්ධ ලකුණු/ Z ලකුණු ..................... (අකුරෙන්) .................... බව සහතික කරමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :__________.

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

__________,
සාමාදාන විනිශ්චයකාරතැනගේ අත්සන.
නම
නිල මුද්‍රාව.

දිනය :__________.

10-350

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.